# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2318/24 - 2023 පෙබරවාරි මස 09 වැනි බ්‍රහස්පතින්දා - 2023.02.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**2017 අංක 16 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතින් සංශෝධිත(262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66ආ (2) වගන්තිය යටතේ වාරියපොල ප්‍රාදේශීය සභාවේ උප සභාපති ධුරයේ පුරප්පාඩුව පිරවීම**

පක්ෂ සාමාජිකත්වය අහෝසි වීම හේතු කොට ගෙන වාරියපොල ප්‍රාදේශීය සභාවේ උප සභාපති ධුරය පුරප්පාඩු වී ඇති හෙයින්ද;

ඉහත කී ආඥාපනතේ 66ආ(2) වන වගන්තිය යටතේ තනතුර දැරූ උප සභාපති වන තෙන්නකෝන් මුදියාන්සේලාගේ අනුර සුදර්ශන අයත් වන්නා වූ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ නම් පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහක (30) කාල පරිච්ඡේදය ඇතුළත උප සභාපති වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශයට පත්කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම වාරියපොල ප්‍රාදේශීය සභාවේ උප සභාපති පිළිබඳව තීරණය කිරීමට, මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා තෙලිකඩ පල්ලිය ගුරුගේ අනුෂා නිල්මිණි සෙනෙවිරත්න නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද;

වාරියපොල ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී රත්නායක මුදියන්සේලාගේ හරේන්ද්‍ර බණ්ඩාර රත්නායක වන මම, 2017 අංක 16 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතින් සංශෝධිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වන අධිකාරය වූ) 66ආ(2) වන වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, තෙලිකඩ පල්ලිය ගුරුගේ අනුෂා නිල්මිණි සෙනෙවිරත්න වාරියපොල ප්‍රාදේශීය සභාවේ උප සභාපති වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

ආර්.එම්.එච්.බී. රත්නායක,
තේරීම්භාර නිලධාරී,
වාරියපොල ප්‍රාදේශීය සභාව.

2023 පෙබරවාරි මස 06 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
කුරුණෑගල.

EOG 02-0074

1A - G 38798 — 16 (2023/02) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*